පුද්ගලයන්ට පිළිලැබීමට හා සිය ජීවිත නැවත ගොඩනගා ගැනීමට උපකාර කරන වැඩසහටනක් වේ. මෙම වැඩහටහන මගින් පුද්ගලයන්ට ජීවත් වීමට ආරක්ෂිත ස්ථානයක් සොයා ගැනීමට, වෛද්‍ය රැකවරණ, උපදේශන, නෛතික සේවා හා සංක්‍රමණ උපදෙස් ලබා ගැනීමට, මූල්‍ය ආධාර, අධ්‍යා පනය හා පුහුණුව හෝ රැකියාවක් සොයා ගැනීමට හා සමාජ සම්බන්ධතා සඳහා උපකාර කරයි. මේ වැඩසටහන ගැන වැඩිදුර විස්තර රතු කුරුස සංගමය වෙතින් ලබ ගත හැකිය.

මෙම කටයුතුවලට සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ජාවාරම්වලට ලක්වූවන් සම්බන්ධ වැඩසටහන යටතේ අරමුදල් සපයයි.

හදිසි අවස්ථාවක දී හෝ කිසිවකු ගේ ආරක්ෂාවට තර්ජනයක් ඇත්නම් **000** ඔස්සේ පොලිසිය අමතන්න.

**තොරතුරු දැන ගැනීමට හෝ රහසිගතව උපදෙස් ලබා ගැනීමට ඔස්ට්‍රේලියානු රතු කුරුස සංගමය අමතන්න.**

ටෙලි. 03 9345 1800

ඊමේල්. national_stpp@redcross.org.au

වෙබ්. redcross.org.au/workrighthub

*This Modern Slavery grant activity received grant funding from the Australian Government.*

SINHALESE

Australian Red Cross

# ඔස්ට්‍රේලියාව තුළ නූතන වහල් සේවය සිදුවෙයි



ඔබ හෝ දන්නා කෙනෙක් සේවා ස්ථානයේ දී සූරා කැමට ලක්වන්නේ නම්, උදව් තිබේ.

# සේවා ස්ථානයේ දී ඔබට සාධාරණව සැලකිය යුතුය

ඔස්ට්‍රේලියාවේ සියලු සේවකයන්ට මූලික අයිතීන් ඇති අතර ඔවුන් නීතිය මගින් ආරක්ෂා කොට ඇත. මෙම නීති මගින්, විදේශයන් සිට පැමිණ සිටින සේවකයන් ද ඔවුන් මෙහි සිටින කාලය හෝ වීසා කාණ්ඩය නොසලකමින් ආවරණය කරනු ලබයි.

සේවා ස්ථානයේ දී බරපතල ලෙස සූරාකෑම ඔස්ට්‍රේලියා ව තුළ අපරාධයක් වේ.

## ඔබ හෝ දන්නා කෙනෙක්ගෙන්:

- බලෙන් වැඩ ගැනීම හෝ අනාරක්ෂිතව වැඩ ගැනීම
- ඉතාම කෙටි විවේකයක් දෙමින් දිගු පැය ගණනක් වැඩ ගැනීම
- නිසියාකාරව වැටුප් නොගෙවීම
- ගමන් වියදම්, නවාතැන්, නිල ඇඳුම්, ප්‍රවාහනය හෝ රැකියා ලියකියවිලි සඳහා බඳවා ගන්නෙකුට හෝ සේවා යෝජකයකුට විශාල ණයක් ගෙවමින් සිටීම
- සේවා ස්ථානයෙන් අස්වී යා නොහැකි වීම හෝ තත්ත්වයන් සාකච්ඡා කොට විසඳා ගත හැක නොවීම
- සේවා ස්ථානයේ දී පිටුවහල් කරන බව හෝ පවුලේ අයට හානි සිදු කරන බව කියමින් පොලඹවා ගැනීම හෝ තර්ජනය කිරීම සිදුවීම
- ඔබේ ගමන් බලපත්‍රය හෝ සෙසු අනන්‍යතා ලේඛන ලබා ගත නොහැකි වීම
- නිවෙසක වැඩ කරන අයෙකුට කලාතුරකින් පමණක් පිටතට යාමට ඉඩ දීම

## උදව් තිබේ.

## උදව් ලබා ගන්නේ කෙසේද

රතු කුරුස සංගමය මගින් උපදේශ හා උපකාර ලබා දෙන අතර උදව් සඳහා ඔබව වෙනත් සේවාවන් වෙත ද යොමු කළ හැකිය. භාෂණ පරිවර්තක සේවා තිබේ.

**03 9345 1800** අමතන්න නැත්නම් **national_stpp@redcross.org.au** වෙත ඊමේල් යොමුකරන්න.

සේවා ස්ථානයේ ඔබේ අයිතිවාසිකම දැනගැනීමට **www.fairwork.gov.au** වෙත යන්න. නැත්නම් **13 13 94** ඔස්සේ ඔම්බුඩ්ස්මන් අමතන්න.

භාෂණ පරිවර්තකයකු අවශ්‍ය නම් **13 14 50** ඔස්සේ පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව අමතන්න.

නූතන වහල්භාවය විය හැකි අවස්ථාවක් ගැන වාර්තා කිරීමට **131 237** ඔස්සේ ඔස්ට්‍රේලියා ෆෙඩරල් පොලිසිය අමතන්න.